වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2020

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

தேசியதொழில்முயற்சிஅபிவிருத்திஅதிகாரசபை

National Enterprise Development Authority

කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும்

Ministry of Industry

NEDA

හැදින්වීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2016 අංක 07 දරන පාර්ලිමේන්තු පනත යටතේ 2006 වර්ශයේදී පිහිටුවන ලදී.ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට පහසුකම් සැපයීමට මෙම ආයතනය වෙත බලය පැවරී ඇත.දේශීය ව්‍යවසායකයන් හට යටිතල පහසුකම් මූල්‍ය හා ප්‍රතිපත්ති මට්ටමේ සහයෝගය ලබා දීම සඳහා අධිකාරී පනතේ නීති මගින් බලය පවරා ඇත.

රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා මග පෙන්වීම අනුව කළාපීය මට්ටමේ මෙන්ම ජාතික මට්ටමේ විවිධ ක්‍රියාකාරකම් සඳහා අධිකාරිය සම්බන්ධ වී ඇත.ආයෝජන ප්‍රවර්ධනය හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ 2006 වර්ශයේ සිට 2010 වර්ශය දක්වා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ලැයිස්තුගත වී තිබුනි.ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2010 වර්ශයසිටකර්මාන්ත හා වාණිජ්‍ය කටයුතුඅමාත්‍යාංශයයටතට පත්වී මේ දක්වා කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියසුළු හා මධ්‍ය පරිමාණව්‍යවසායකයන් හට ප්‍රාදේශිය ලේඛම් කොට්ඨාශ මට්ටමෙන් විවිධ වැඩසටහන් ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ආරම් භ කරන්නට යෙදුණි.එ ය රාජ්‍ය හා පුද්ගලික බැංකු, ව්‍යාපාරික මන් ඩල, රාජ්‍ය නොවන සංවිධාන (දේශීය හා විදේශීය) ආදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා සම්බන්ධ වී ඇත.මෙම වැඩසටහන් වල පරමාර්ථය වි ඇත්තේ බිම් මට්ටමේසුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්හටමූල්‍ය සහයෝගීතාවය, පුහුණු හා උපදේශක සහයෝගීතාවය වැනි මූලික අවශ්‍යතාවයන් සැපයීම වේ.ප්‍රාදේශිය ලේඛම්කාර් යාල මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සම් බන් ධීකරණය සඳහා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් ප්‍රාදේශිය ලේඛම් කාර් යාල වලට අනුයුක්ත කර ඇත.



දැක්ම

“ජාතියේආර්ථික, දේශපාලනික හා සමාජ අභිලාෂයන් සපුරාලීමෙහි ලා දායකත්වය සැපයිය හැකි තරඟකාරී ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයක් ශක්තිමත් හා තිරසාර අන්දමින් ගොඩනැංවීම”

මෙහෙවර

“ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයේ ප්‍රමුඛ අංගයක් වශයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) යටතේ ඇති **ව්‍යවසායන්හි සංවර්ධනය, පැවැත්ම හා තරඟකාරීත්වය නැංවීම උදෙසා පහසුකම් සැපයීම හා සක්‍රිය අන්දමින් සහාය දැක්වීම”**

අරමුණු

- ✓ ශ්‍රී ලංකාව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය දිරිගැන්වීමප් ,රවර්ධනය සහ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයප්තිය හා සංවර්ධනය වේගවත් ව්‍යා , .කිරීමට දිරි දීම
- ✓ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි **(NEDA)** පනතේ පරමාර්ථයන්ඉටුකිරීමෙහිලාවිදේශීයවෙළඳපොළඅවශ්‍යතා සැපිරිය හැකි දේශීය ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් බැහැරව අන්තර්ජාතික මට්ටමින් ස්ථාපිත කොට පවත්වාගෙන යාමට හැකි පරිදි සැලසුම් කිරීමට පෙළැඹවීම හා ඒ සඳහා දිරිගැන්වීම.
- ✓ කර්මාන්ත හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි වෙළඳ හා සංවර්ධන කටයුතු ඵලදායී අන්දමින් ප්‍රවර්ධනය කිරීමට සහ සහාය වීමට අවශ්‍ය වන්නා වූ ප්‍රතිපත්තිසැළසුම් සහ ස ,ැළසුම්ගත ප්‍රවර්ධන දිරිදීමනා සම්පාදනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වශයෙන් තාක්ෂණික කුසලතා පරිපූර්ණ මානව ප්‍රාග්ධනයක් වශයෙන් ජනතාව සවිබල ගැන්වීම.
- ✓ සංවර්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වයට ප්‍රවේශය සඳහා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම .
- ✓ නිශ්පාදන සංවර්ධනය වාණිජකරණය තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ පේටන්ට් බලපත්‍ර , සම්බන්ධයෙන් වන පර්යේෂණ හා සංවර්ධනය ඉහල නැංවීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම .
- ✓ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට පහසුකම් සැලසීම.

අධ්‍යක්ෂකමණ්ඩලය

අනුෂ්ක ගුණසිංහ මයා	සභාපති
ලක්දාස් මයා අතිරේක ලේකම්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය	කමිටු සාමාජික
පී.ජී.පී. රසාංජලී මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව,මහා භාණ්ඩාගාරය	කමිටු සාමාජික
ඉන්දික නිශාන්ත ගුණරත්න මයා	කමිටු සාමාජික
කඩුපිටිගේ ප්‍රසාද් ජයරංග සිල්වා මයා	කමිටු සාමාජික
අමරසිංහගේ හේමසිරි පෙරේරා මයා	කමිටු සාමාජික
ඒ.එල්. බුද්ධික සඳරුවන් මයා	කමිටු සාමාජික
ජේ.එම්. ආනන්ද ප්‍රේමතිලක මයා	කමිටු සාමාජික
අසංක විජේසුන්දර මයා	කමිටු සාමාජික

2024 ජනවාරි 17

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රමේෂ් පතිරණ මහතා

කර්මාන්ත අමාත්‍ය

කර්මාන්ත අමාත්‍යාංශය

අංක 73/1,

ගාලු පාර

කොළඹ 03

ගරුඅමාත්‍යතුමනී,

වාර්ෂික වාර්තාව 2020

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වහන්තිය ප්‍රාකාර පහත සඳහන් ලියවිලි මේ සමග ඉදිරිපත් කරමි.

1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2020 වර්ශය සඳහා වූ ප්‍රගති වාර්තාව
2. 2020දෙසැම් බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය,ආදායම්පිළිබඳප්‍රකාශනය, හිමිකම්වෙනස්වීම්පිළිබඳප්‍රකාශනය
3. **විගණකාධිපති වාර්ථාව**

ඔබේ අවංක,

ලසන්ත කාරියප්පෙරුම
සභාපති / අධ්‍යක්ෂ ජනරාල්

වාර්ෂික වාර්තාව 2020

සංවර්ධන වැඩසටහන්

වැඩසටහන 01 : ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් පිලිබඳ මාර්ගෝපදේශය සකස් කිරීම

වැඩසටහන 02 : ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ දත්ත පදනම සකස් කිරීම

වැඩසටහන 03 : ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

වැඩසටහන 04 : පොකුරු/ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන

වැඩසටහන 05 : ව්‍යවසායකත්ව සංසද

වැඩසටහන 06 : විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම

වැඩසටහන 07 :“ උපාධිධාරී ව්‍යවසායක උදානය” වැඩසටහන

වැඩසටහන 08 : ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

වැඩසටහන 09 : ‘‘මේඩ් ඉන් ශ්‍රී ලංකා’’වෙළඳ නාමයප්‍රවර්ධනය හා පිරිනැමීම

වැඩසටහන 10 : වෙනත් වැඩසටහන්

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

සංවර්ධන වැඩසටහන් - 2020

වැඩසටහන 01 : ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් පිලිබඳ මාර්ගෝපදේශය සකස් කිරීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (MSME)සඳහා මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සඳහා ව්‍යාපාර සංවර්ධන සේවා මාර්ගෝපදේශ අත්පොත ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර ඇත. මෙම මාර්ගෝපදේශයෙහිව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් වන අතර, සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙහිලා මහ පෙන්වීමේ ලේඛනයක් වශයෙන්මෙය ඉතා ප්‍රයෝජනවත් වනු ඇත (පිටු 200 ක් පමණ). ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින්, අධිකාරිය යටතේ සේවය කරන සංවර්ධන නිලධාරීන්ගෙන් සහ පුවත් පත් වෙළඳ දැන්වීම් මගින් තොරතුරු එක්රැස් කිරීමට කටයුතු කරන ලදි.මෙම මාර්ගෝපදේශය2021 පළමු කාර්තුවේදී ප්‍රකාශයට පත්කිරීමට සැළසුම් කොට තිබිණි. (පවතින කොවිඩ් 19 තත්ත්වය හමුවේ මුද්‍රණ කටයුතු ප්‍රමාද වී ඇත)

වැඩසටහන 02 : ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ දත්ත පදනම සකස් කිරීම

ශ්‍රී ලංකාව තුළ මිලියනයක පමණ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංඛ්‍යාවක් විසිර පවතී. එනමුත් එක් දත්ත පදනමක් මගින් මෙම තොරතුරු ලබාගැනීමට හැකි පරිදි දත්ත පදනමක් කිසිදු ආයතනයක් මගින් සකස් කොට නොමැත. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් පිළිබඳ දත්ත පදනමක් නොමැතිවීම මෙම ක්ෂේත්‍රයේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය උපාය මාර්ගික තීරණ ගැනීමෙහිලා බලපාන්නා වූ විශාල ගැටළුවකි. එම හේතුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් විසින් ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු මෘදුකාංග මත රැස්කොට තැබීම හා වරින් වර යාවත්කාලීන කිරීමට පොළඹවන ලදි. ඒ අනුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පිළිබඳ දත්ත පදනමක් ස්ථාපිත කරන ලද අතර, එය 2020 දෙසැම්බර් මස 15වන දින එළිදක්වන ලදි.

වැඩසටහන 03 : ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

මෙරට මුළු ව්‍යාපාර සංඛ්‍යාවෙන් 75%ක් පමණ ආවරණය කිරීමත්, රැකියා නියුක්තියෙන් 45%ක් සැපයීම හා දළ දේශීය නිශ්පාදනයෙන් 52%ක ප්‍රමාණයක් සඳහා දායකවීමත්, යනාදී කරුණු හේතුවෙන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ජාතික ආර්ථිකයේ කොඳු නාරටිය වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ඇත.සංවර්ධනය පුළුල් සමානාත්මතාවයකින් යුතුව ප්‍රවර්ධනය වන ආකාරයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ක්‍රියාත්මක වන අතර, මෙරට ආර්ථික සංවර්ධනය තුළ කාන්තා හා තරුණ සහභාගීත්වය ඉහල දැමීම සඳහා වැඩි අවස්ථා හිමිකර දෙනු ලබයි.ශ්‍රී ලංකාවේ ප්‍රගමනය හා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කරන උපාය මාර්ගික ක්ෂේත්‍රයක් වශයෙන්ද

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් හඳුනාගෙන ඇත.වසර ගණනාවක ඇවෑමෙන්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්, රැකියා නියුක්තිය, ආදායම් උත්පාදනය, දරිද්‍රතාවය තුරන්කිරීම හා ප්‍රාදේශීය සංවර්ධනය යනාදියෙහි ප්‍රධානතම ප්‍රභවයක් වශයෙන් ඉහල පිළිගැනීමකට ලක්ව ඇත. කෘෂිකර්මාන්තය, පතල් කර්මාන්තය, නිශ්පාදන කර්මාන්තය, සේවා සැපයුම් හා ඉදිකිරීම් කර්මාන්තය යනාදී පුළුල් ක්ෂේත්‍රයක් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මගින් ආවරණය කෙරේ.

නිෂ්පාදන ක්‍රියාවලිය හා සාධක වෙළඳපලත්, ඒවා ක්‍රියාත්මක වන නියාමන පද්ධතියෙන් මතුවන ගැටළු යනාදියත් හේතුවෙන්ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි වර්ධනය හා ව්‍යාප්තිය සීමා වී ඇත. මෙකී ගැටළු, මූල්‍ය ප්‍රතිපාදන වෙත ප්‍රවේශය, භෞතික යටිතල පහසුකම්, තාක්ෂණික මට්ටම, නියාමන රාමුව, තොරතුරු හා උපදෙස් සඳහා ප්‍රවේශය, වෙළඳපල වෙත ප්‍රවේශය, ව්‍යාපාර සංවර්ධන සේවා, කාර්මික සම්බන්ධතා සහ කම්කරු නීති, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, තාක්ෂණික හා කළමනාකරණ කුසලතා, සම්බන්ධතා ගොඩනැගීම සහ පාරිසරික ගැටළුයනාදී පුළුල් ක්ෂේත්‍රයක් පුරා විසිර පවතී.

බොහොමයක් ව්‍යවසායකයින්ට ව්‍යවසායකත්වය, අලෙවිකරණය, තාක්ෂණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකමවැනි ගැටළු පවතින බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුනා ගන්නා ලදි. එසේම, ඔවුන්ගේ ව්‍යාපාරය ආරම්භ කිරීමට / පුළුල් කිරීමට අවශ්‍ය වන්නා වූ මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ බාධක වලට මුහුණ පෑමටද ඔවුන්ට සිදුව තිබේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේසංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් කාර්යයන් ඉටුකරමින් සිටින අතර, ඉහත කී ගැටළු සඳහා විසඳුම් අවශ්‍ය වන්නා වූ ව්‍යවසායකයින් ඔවුන් විසින් හඳුනාගනුලබයි.

එබැවින්, සියලුම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායකයින් සඳහා කෙටිකාලීන ධාරිතා සංවර්ධන පුහුණුව, මූල්‍ය සහාය, වෙළඳපල පහසුකම් සහ වෙනත් ව්‍යවසාය සංවර්ධන සේවා සහ පසු විපරම් සේවා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින්ක්‍රියාත්මක කරයි. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියවිසින් සංවර්ධන නිලධාරීන්ගෙන් ව්‍යාපෘති යෝජනා ලබාගෙන ප්‍රාදේශීය / දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍යමය සහාය සපයනු ලබයි.

2020 වර්ෂයේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ව්‍යවසායකයින් 4855 දෙනෙකුට පුහුණුව ලබාදෙන ලදි. ඊට අමතරව, නාගරික සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව නවක ව්‍යවසායකයින් 30 දෙනෙකු සඳහා කොළඹ දී (දෙමටගොඩ) ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනක් ද, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සහාය මත තරුණ තරුණියන් 65 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදි. එමෙන්ම, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් කාන්තා ව්‍යවසායකයින් (ව්‍යවසායිකාවන් 200ක්) සඳහා ද ව්‍යවසාය සංවර්ධන වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලදි.





තාක්ෂණික පුහුණුව

වැඩසටහන 04: පොකුරු / ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා විවිධාංගීකරණය සඳහා වූ ධාවකයක් ලෙස පිළිගැනේ. කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට හුදෙකලා ආකාරයෙන්,අගය දාමය තුළ ස්වාධීනව කටයුතු කිරීමට සිදුවී ඇත.එනමුත්, තරඟකාරීත්වයට අඛණ්ඩව ප්‍රතිචාර දැක්වීමේ හැකියාව තනිව වර්ධනය කර ගැනීමක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ටදුෂ්කර කාර්යයකි.මෙම ගැටළුව මහහරවා ගැනීම සඳහා, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්සංවර්ධනය සඳහා පොකුරු / ක්ෂේත්‍ර පදනම් කරගත් ප්‍රවේශය අත්හදා බැලීම කළයුතුව ඇත.

පොකුරු/ ක්ෂේත්‍ර පදනම් කරගත් ප්‍රවේශය තුළපවතින වාසි රැසකි. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකපොකුරුවලට පුහුණුව හා තාක්ෂණික නවෝත්පාදනයන්, මූල්‍ය ප්‍රතිපාදන සඳහා පහසු ප්‍රවේශය සහ වැඩි ආයතනික සහායක් ලබා ගැනීමේ අවස්ථා පවතී. විවිධ ස්ථානවලක්‍රියාත්මක වන තනි ව්‍යාපාරවලට සේවා සැපයීමට වඩාපොකුරක් වශයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපාර සමූහයකට ව්‍යාපාර සංවර්ධන සේවාවන් සැපයීම රජයට සහ අනෙකුත් සහායක සේවා සැපයීමේ ආයතනවලට වඩා ලාභදායී වේ.

ඉලක්කගත කණ්ඩායම් සඳහා පහසුකම්/ සේවාවන් :

1. ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන : ඉලක්කගත කණ්ඩායම් සඳහා ව්‍යවසායකත්ව සහ ධාරිතා සංවර්ධන පුහුණුව
2. තාක්ෂණික දැනුම වැඩිදියුනු කිරීමේ වැඩසටහන්
3. ව්‍යාපාර සැළසුම්, මූල්‍ය සහාය, වෙළඳපොළ සංවර්ධන වැඩසටහන්, උපදේශන සේවා යනාදී...



ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනත හා සංයුක්ත සැළැස්මට අනුව, ශ්‍රී ලංකාවේ හඳුනාගත් පොකුරු/ක්ෂේත්‍ර සඳහා 2020 වසරේදී පොකුරු සංවර්ධන වැඩසටහන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් පවත්වන ලදි.

1. දුම්ගැසූ කරවල (අම්පාර දිස්ත්‍රික්කය) – විදුලි පෝරණු පහසුකම් සැපයීම තුළින් මිරිදිය මත්ස්‍ය කරවල නිශ්පාදකයින් සවිබල ගැන්වීමට.
2. කජු වගාව (මඩකළපුව දිස්ත්‍රික්කය) – බාධක අවම කිරීම, නව නිශ්පාදන තාක්ෂණය ලබාදීම, උපකරණ හිඟයට විසඳුම් ලබාදීම හා නාස්තිය අවම කිරීම හරහා කම්කරුවන්ගේ ජීවනෝපාය ඉහල නංවමින් කජු වගා කිරීමේ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට.

3. ඇන්තූරියම් වගාව (මොණරාගල දිස්ත්‍රික්කය)– ක්ෂේත්‍රයට නව වගාකරුවන් හඳුන්වාදීම සහ කර්මාන්තයේ අවශ්‍යතාවයට සරිලන අන්දමින් ඔවුන් ගොඩනැගීම මගින් ක්ෂේත්‍රය පුළුල් කිරීමට.
4. ජපන් ජබර ව්‍යාපෘතිය (කුරුණෑගල දිස්ත්‍රික්කය) – ජපන් ජබර භාවිතයෙන් පරිසර හිතකාමී ද්‍රව්‍ය නිශ්පාදනය ප්‍රවර්ධනයට.
5. පාවහන් නිශ්පාදනය (කොළඹ දිස්ත්‍රික්කය) – රැකියා අවස්ථා නිර්මාණය කිරීමට.



වෙනත් පොකුරු වැඩසටහන්:

මොරටුව දැව භාණ්ඩ නිශ්පාදකයින්ගේ පොකුරු වැඩසටහන: සමුළුව පවත්වන ලද අතර, ගැටළු සාකච්ඡා කරන ලදි. (ගරු ඇමතිතුමාගේ සහභාගීත්වයෙන්)





ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රය**: ඇඟලුම් කර්මාන්තයේ ව්‍යවසායකයින් සඳහා සමුළුවක් පවත්වා, ගැනුම් විකුනුම් හමුවක් ද පවත්වන ලද අතර, ඒ පිළිබඳ වාර්තාවක් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි.** මූලික සාකච්ඡාව ඇඟලුම් ක්ෂේත්‍රයේ නිරතව සිටින පමුනුව ප්‍රදේශයේ ව්‍යවසායකයින් සමග පවත්වන්නට යෙදිණි.

හඳුන්කුරු නිශ්පාදනය: ව්‍යාපාරික ගැටලු නිරාකරණය සඳහා ගරු අමාත්‍යතුමාගේ සහභාගීත්වය සහිතව සාකච්ඡාවක් පවත්වන ලදි.

වැඩසටහන 05: ව්‍යවසායකත්ව සංසද

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි කොටසක් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පවත්වාගෙන යාම හෝ එම කර්මාන්තය තුළ සේවය කිරීම සිදුකරයි. එහෙයින්, මෙකී ව්‍යවසායයන් සඳහා හිතකර හා ගතික ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම වැදගත් වේ. ඒ මත පදනම්ව, ප්‍රාදේශීය තත්ත්වයන්ට අනුකූලව සාම්ප්‍රදායික සංවර්ධන උපාය මාර්ග සඳහා යොදාගත හැකි ආකර්ශනීය විකල්පයක් වශයෙන් දේශීය ආර්ථික සංවර්ධනය (LED) හැඳින්විය හැක.

දේශීය ආර්ථික සංවර්ධනය යනු සංවර්ධනය සඳහා සහභාගීත්ව ප්‍රවේශයකි. දේශීය ආර්ථික විභවයන් හඳුනා ගැනීම උදෙසා ප්‍රාදේශීයව, ජාතික රජයන් හා ජාත්‍යන්තර සංවිධාන සමග එක්ව දේශීය පාර්ශ්වකරුවන් පුළුල් පරාසයක කටයුතු කරනු ලබයි. මෙහි ඇති සහභාගීත්ව දැක්ම මගින්, දේශීය ආර්ථික සංවර්ධන වැඩසටහන, දේශීය පෞද්ගලික හා රාජ්‍ය අංශ අතර මෙන්ම සමාජ හා දේශපාලනික කණ්ඩායම් අතර අවස්ථාවන් සහ හවුල්කාරීත්වයන් ගොඩනගනු ලබයි.

දේශීය ආර්ථික සංවර්ධනය සඳහා රාජ්‍ය - පෞද්ගලික කතිකාවතක් නිර්මාණය කිරීම උදෙසා, රජයේ බලයලත් ආයතන නියෝජිතයින්, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන, රජයේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සහ ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් රට තුළ ස්ථාපිත කොට ඇති එක් එක් ව්‍යාපාර අංශයන් නියෝජනය කරමින් එහි ප්‍රධාන ව්‍යවසායකයින් යනාදී කණ්ඩායම් සියල්ල ව්‍යවසායකත්ව සංසදමගින් එක් ස්ථානයකට රැගෙන එනු ලබයි.

ජාතික ව්‍යවසායකත්ව සංසදය: සියළුම ජාතික මට්ටමේ රාජ්‍ය හා පෞද්ගලික අංශ පාර්ශ්වකරුවන්, ප්‍රධාන ව්‍යවසායකයින් මෙම සංසදය තුළ නියෝජනය වන අතර, එහි සභාපතිත්වය අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් දරනු ලබයි.

දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසදය: සියළුම දිස්ත්‍රික් / පළාත් මට්ටමේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්, ප්‍රධාන ව්‍යවසායකයින් මෙහි නියෝජනය කරනු ලබන අතර, දිස්ත්‍රික් ලේකම් විසින් සභාපතිත්වය දරනු ලබයි. සුදුසු පාර්ශ්වකරුවන් මෙම සංසදයට කැඳවීමේ බලය දිස්ත්‍රික් ලේකම්ට හිමි වේ.

ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසදය: සියළුම ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය හා පෞද්ගලික අංශ පාර්ශ්වකරුවන්, ප්‍රධාන ව්‍යවසායකයින් මෙහි නියෝජනය වන අතර, ප්‍රාදේශීය ලේකම් විසින් සභාපතිත්වය දරනු ලබයි. සුදුසු පාර්ශ්වකරුවන් සංසදයට කැඳවීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට හිමි වේ.

ව්‍යවසායකත්ව සංසදයේ අරමුණ හා කාර්යභාරය

ව්‍යවසායකත්ව සංසදයේ අරමුණ වනුයේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය තුළින් දේශීය ආර්ථික සංවර්ධනයට හා වර්ධනයට පුළුල් දායකත්වයක් ලබාදීමයි. ඒ අනුව, ඉහත කී අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා පහසුකම් සපයන්නා වශයෙන් කටයුතු කිරීම හා සාකච්ඡාමය සංසදයක් වශයෙන් ක්‍රියාත්මක වීම ව්‍යවසායකත්ව සංසදයේ කාර්යභාරය වේ. සවිස්තරාත්මක වශයෙන්, ව්‍යවසායකත්ව සංසදයේ කාර්යභාරය වනුයේ:

ව්‍යවසායකත්ව සංසදයේ කාර්යභාරය

1. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනය සඳහා එහි සාමාජිකයින් අතර අඛණ්ඩ උපදේශන සේවා සහ කතිකාවත් පවත්වාගෙන යාම.
2. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනයට දායක වන පාර්ශ්වකරුවන් අතර සබඳතා ජාල ගොඩනගා ගැනීමේ පහසුකම් සැළසීම.

3. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ ගැටලු සඳහා විසඳුම් සෙවීම සහ විසඳුම් ලබාදීමෙහිලා දායකත්වය සැපයීම.
4. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සම්බන්ධයෙන් පැන නගිනගැටලු ජාතික මට්ටමට රැගෙන යාම උදෙසා උපදේශන සේවා සැපයීම සහ සාකච්ඡා අවස්ථා සඳහා පහසුකම් සැළසීම.
5. කළාපය තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනයට අදාළ යෝජනා ඉදිරිපත් කිරීම, ප්‍රවර්ධනය සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
6. ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය රාජ්‍ය ආයතනවල ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන සැළසුම් සකස්කිරීමට දායකත්වය සැපයීම.
7. ප්‍රාදේශීය සම්පත් ප්‍රශස්ත අන්දමින් භාවිතයට ගැනීම ප්‍රවර්ධනය කිරීම.
8. වාණිජ මණ්ඩලය හරහා ආයෝජන සහ අපනයන ප්‍රවර්ධනයට පහසුකම් සැළසීම.
9. රජය සහ දායකත්ව ආයතන මගින් අනුග්‍රහය දක්වන සංවර්ධන වැඩසටහන් හා පවතින අවශ්‍යතා අතර සම්බන්ධතා ගොඩනැගීම.

සාමාජිකයින්

ව්‍යවසායකත්ව සංසදයේ සාමාජිකයින් මත සංසදයේ සාර්ථකත්වය රඳා පවතී. ඒ අනුව සංසදය තුළ කිසිදු පාර්ශවයක් මගින් ඇතිවිය හැකි බලපෑම් වලක්වා ගතහැකි පරිදි, රාජ්‍ය හා පෞද්ගලික සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන යනාදී සියළු ආයතනවල සම්මිශ්‍රණයකින් යුත් සමබර සාමාජික සංඛ්‍යාවක් පවත්වා ගැනීම අතිශයින් වැදගත් වේ. සාමාජිකයින්ට සිය ආයතනවල තීරණ ගැනීමේ බලතල සහිත නම් සංසදය වඩාත් කාර්යක්ෂම හා සාර්ථක තත්ත්වයට පත්වේ. එහි සංයුතිය: රජයේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් (අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ යටතේ පවතින ආයතන), පෞද්ගලික ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්, දිස්ත්‍රික් / පළාත් වාණිජ සහ කර්මාන්ත මණ්ඩල, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංගම්, රාජ්‍ය නොවන සංවිධාන (ව්‍යාපාර සංවර්ධන සේවා සපයනු ලබන) රාජ්‍ය හා පෞද්ගලික බැංකු, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ එක් එක් ව්‍යාපාර අංශයන්හි ප්‍රමුඛ ව්‍යවසායකයින් යන සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය.

ව්‍යවසායකත්ව සංසදය ක්‍රියාත්මක වන ආකාරය

සාර්ථකත්වයටපත්වීමට හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍ර පිළිබඳව රාජ්‍ය-පෞද්ගලික කතිකාවත අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ව්‍යවසායකත්ව සංසදය නිසි පරිදි පැවැත්වීම අත්‍යවශ්‍ය වේ. තව ද, සංසදයේ තීරණවලට රට තුළ ඉහලම මට්ටමේ සහායක් ලැබෙන බවට සහතික කෙරේ. ව්‍යවසායකත්ව සංසදය පැවැත්වීමට අවශ්‍ය සියළුම ප්‍රායෝගික කටයුතු සංවිධානය කිරීමේ බලතල සහිත ලේකම් කාර්යාලයක් එහි සභාපතිගේ සහාය සඳහා පත්කළ යුතු වේ. තව ද, රැස්වීම් වල දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ දී එම කටයුතු සම්බන්ධීකරණය හෝ ක්‍රියාවට නැංවීම සඳහා විවිධ අංශ නියෝජනය කරන සංසද සාමාජිකයින් පත්කිරීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම, සහාය ලබාගැනීම අවශ්‍ය වන්නා වූ නිශ්චිත ක්‍රියාකාරකම් සඳහා සහාය දැක්විය හැකි අනු කමිටු හෝ ක්‍රියාකාරී කණ්ඩායම් තෝරා ගැනීමේ හැකියාව මෙම සංසදය සතුය. කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලබයි.



2020 වසර දක්වා, දිස්ත්‍රික්ක 14ක ව්‍යවසායකත්ව සංසද ස්ථාපිත කර ඇති අතර, දිස්ත්‍රික්ක 7ක රැස්වීම් පවත්වා ඇත. (2020 ජනවාරි - දෙසැම්බර්). තව ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 236ක ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද ස්ථාපිත කිරීමට කටයුතු කරන ලද අතර, ජාතික ව්‍යවසායකත්ව සංසදය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදි.

වැඩසටහන 7: "උපාධිධාරී ව්‍යවසායකත්ව උදානය" වැඩසටහන

සංඛ්‍යාලේඛන දත්ත අනුව, රැකියා අවස්ථා ලබාදීම සහ දළ දේශීය නිශ්පාදනයට (GDP) දායකත්වය සැපයීම තුළින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. 2013 වසරේ දී, මෙරට දළ දේශීය නිශ්පාදනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ගේ දායකත්වය 40%ක් වන අතර, 2014 වසරේදී එම අගය 52%ක් විය. විශේෂයෙන්, ජාත්‍යන්තර කම්කරු ආයතනයේ (ILO) සංඛ්‍යාලේඛන මගින් පෙන්වා දෙන අන්දමට තරුණ විරැකියා මට්ටම අඛණ්ඩව ඉහළ යමින් පවතින අතර, තරුණ විරැකියාවට එක් විසඳුමක් වශයෙන් තරුණ තරුණියන්ට ව්‍යවසායක ක්ෂේත්‍රයට පැමිණීමට සහාය ලබාදීම නිර්දේශ කොට ඇත.

එකී තත්ත්වය අවබෝධ කොට ගනිමින්, උපාධිධාරීන්ගේ හැකියාවන් වර්ධනය කොට, ව්‍යාපාරික ලෝකයේ අවස්ථාවන් හිමිකර ගැනීම සඳහා ඔවුන් මෙහෙයවමින්, සාර්ථක ව්‍යවසායකයින් බවට පත්වීමට උපාධිධාරීන් දිරිමත් කිරීමේ විශේෂිත වැඩසටහනක් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් දියත් කරන ලදි. එකී මූලාරම්භයට සන්නායක පරිසරයක් නිර්මාණය කිරීමෙහිලා ව්‍යවසායකත්ව අධ්‍යාපනය ශක්තිමත් අන්දමින් ලබාදීමට හා මෘදු කුසලතා සංවර්ධනයට වඩාත් යෝග්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කළයුතුව ඇත. ව්‍යවසායක උපාධිධාරීන් බිහිකිරීම සඳහා විශ්ව විද්‍යාලවල වර්තමාන රැකියා මාර්ගෝපදේශ ඒකක මගින් ඉතා වටිනා කාර්යභාරයක් ඉටුකරන බවජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අදහසයි ඒ අනුව එම ඒකක උපාධිධාරී ව්‍යවසායකයින් බිහිකිරීම හරහා අන් අයටද රැකියා අවස්ථා නිර්මාණය කරන ඒකක බවට පත්ව ඇත.

එසේ වුව ද, සමාජ බලපෑම සහ ව්‍යවසායකයෙකු වීමෙන් ලබාගත හැකි වාසි පිලිබඳ නොදැනුවත්කම හේතුවෙන් උපාධිධාරීන් වෙනත් රැකියා සඳහා යොමුවීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. තව ද, උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රය හා සම්බන්ධවීම සඳහා මැලිකමක් දැක්වීමට, ව්‍යාපාරික අවස්ථා පිළිබඳ නොදැනුවත් භාවය, ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දැනුම අඩුකම, මූලික ප්‍රාග්ධනය නොමැතිකම සහ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම තුළ පවතින අවදානම යනා දී හේතු බලපා ඇත.

ඉහත කරුනු සැලකිල්ලට ගනිමින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් උපාධිධාරී ව්‍යවසායකත්ව වැඩසටහන සැළසුම්කොට හඳුන්වා දෙන ලදි.

නිශ්චිත අරමුණු

I. සාර්ථක උපාධිධාරී ව්‍යවසායකයින් බිහිකිරීම.
II. ප්‍රජාවන් සඳහා රැකියා අවස්ථා බිහිකිරීම.
III. උගත් තරුණ ප්‍රජාව ව්‍යාපාරික ක්ෂේත්‍රය කරා යොමුවීම දිරිගැන්වීම.

ඉලක්කගත කණ්ඩායම;

අවසන් වසර උපාධි අපේක්ෂකයින්

මෑත භාගය තුළ විශ්ව විද්‍යාල හැරගිය උපාධිධාරීන් (වසර පහක් වැනි කාල සීමාව තුළ) (ව්‍යාපාරයක් ආරම්භ කළ විගස හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන)

ව්‍යවසායකයෙකු බවට පත්වීමට අදහස් කරන පශ්චාත් උපාධි අපේක්ෂකයින්

ප්‍රධාන ක්‍රියාකාරකම්

ඉලක්කගත කණ්ඩායම් පිළිබඳ දත්ත පදනමක් සකස් කිරීම:පළමු කටයුත්ත වනුයේමෙම වැඩසටහනට සහභාගී වීමේ හැකියාවක් සහිත කණ්ඩායම පිළිබඳ දත්ත පදනමක් සකස් කිරීමයි.විශ්ව විද්‍යාලයේ රැකියා මාර්ගෝපදේශ ඒකකය (CGU) මගින් මෙම වැඩසටහන සඳහා සහභාගී වීමේ සුදුසුකම් සහිත සිසුන්ගේ දත්ත පදනම සකස් කිරීම හා පවත්වාගෙන යාම සිදුකළ යුතු වේ.

ප්‍රචාරණය:පෝස්ටර් ප්‍රදර්ශනය සහ අධ්‍යාපනික ආයතන හරහා මෙම වැඩසටහනේ ප්‍රචාරණ කටයුතු සිදුකරනු ලැබේ.

දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම:අවසන් වසර උපාධි අපේක්ෂකයින්, මෑත කාලයේ විශ්ව විද්‍යාල හැරගිය උපාධිධාරීන් හා පශ්චාත් උපාධිධාරීන් ඉලක්කගත කණ්ඩායම වශයෙන් හඳුනාගෙන ඇතත්, විශ්ව විද්‍යාල අවසන් වසර උපාධි අපේක්ෂකයින් සමග මෙම වැඩසටහනේ ආරම්භක කටයුතු සිදු කෙරේ. ව්‍යවසායකත්ව සංකල්පය විශ්ව විද්‍යාල සිසුන් අතර ජනප්‍රිය කරවීමේ අරමුණෙන්, විශ්ව විද්‍යාල රැකියා මාර්ගෝපදේශ ඒකක සමග එක්ව මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. එමගින්; වැඩසටහන සඳහා සිසුන් සූදානම් කෙරෙන අතර, එය ඔවුන්ට ව්‍යාපාර ක්ෂේත්‍රය සමග සම්බන්ධවීමේ ප්‍රතිලාභ සලසා ගතහැකිමූලික කුසලතා පුහුණුවවැනි විශ්ව විද්‍යාල පරිසරය තුළ පවතින අවස්ථා හඳුනාගැනීමේ හැකියාව ලැබේ.

අයදුම්පත් කැඳවීම සහ ප්‍රතිලාභීන් තෝරාගැනීම; අයදුම්පත් කැඳවා දත්ත පදනමට ඇතුලත් කෙරේ.

අවශ්‍යතා ඇගයීම හා ධාරිතා සංවර්ධනය; ව්‍යවසායකත්ව හා ව්‍යාපාරික සැලසුම් පුහුණුව ලබාදීම

අරමුදල්: ව්‍යාපාරික සැළසුම් සකස් කිරීම ඉතා ක්‍රමානුකූල අන්දමින් සිදු කළයුතු වුවත්, මෙම ව්‍යාපෘති තවදුරටත් පසුව සංවර්ධනය කළහැකි වේ. එසේ වුව ද, ණය ලබාදීමේ දී බැංකු මගින් ව්‍යවසායකයාගේ දායකත්වය විමසනු ලබන නමුත්, බොහෝ අවස්ථාවන්හි දී , පුහුණු වැඩසටහනට සහභාගීවන්නා වූ උපාධිධාරීන්ට අවශ්‍ය දායක මුදල් සපයා ගැනීම දුෂ්කර කාර්යයක් වේ. එබැවින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් උපරිම බැඳීමකට යටත්ව අවශ්‍ය මූල්‍ය සහාය සපයනු ලැබේ.

පසු විපරම්: ව්‍යාපාර ලෝකයට නවකයින් වන උපාධිධාරී ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ සහාය අවශ්‍ය වේ. එබැවින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් විසින් මාස හයක පමණ කාල සීමාවක් මෙම ව්‍යවසායකයින්ට ඉතා මැනවින් පහසුකම් සේවා සපයන අතර, ව්‍යාපාර ලියාපදිංචි කිරීම, ව්‍යාපාර කළමනාකරණය, ගිණුම් වාර්තා තැබීම හා ඇගයීම, තාක්ෂණික හුවමාරුව, කුසලතා සංවර්ධනය, මූල්‍ය සඳහා ප්‍රවේශයට පහසුකම් සැළසීම සහ වෙළඳපොළ ප්‍රවේශයට පහසුකම් සැළසීම යනාදී කටයුතු මගින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ඉතා ශක්තිමත් ආකාරයෙන් මෙම ව්‍යාපාරිකයින් සඳහාපහසුකම් සේවා සපයනු ලැබේ.

2020 වසරේ දෙසැම්බර් මස ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ප්‍රතිපාදන ලබාදීමේ උත්සවයක් පැවැත් වූ අතර, එහි දී, 2019 වසරේදී පුහුණුව ලත් උපාධිධාරීන් 132ක් සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදි.





වැඩසටහන 8: ප්‍රාදේශීය (පළාත්) හා ජාතික මට්ටමේ ව්‍යවසායකත්ව ප්‍රදාන උත්සව

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විශිෂ්ට දායකත්වය සපයා ඇති ව්‍යවසායකයින් පිළිගැනීමට ලක්කිරීම, සම්මානයට පාත්‍ර කිරීම හා දිරිමත් කිරීම යනාදී අරමුණු පෙරදැරිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව සංවිධානය කරනු ලබයි. දිස්ත්‍රික් මණ්ඩල/රාජ්‍ය ආයතනවල සහාය ඇතිව පළාත් නමය තුළ සම්මාන ප්‍රදානෝත්සව නමයක් පැවැත්වීම සංවිධානය කෙරෙන අතර, පළාත් සම්මාන ප්‍රදානෝත්සවයේ ජයග්‍රාහකයින් ඇගයීම සඳහා ජාතික සම්මාන ප්‍රදානෝත්සවයක් ද, ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් සංවිධානය කරනු ලැබේ.

සම්මාන ප්‍රදානය කිරීමේ අරමුණු:

- **දක්ෂතම ප්‍රාදේශීය ව්‍යවසායකයින් පිළිගැනීමට ලක්කිරීම හා සම්මානයට පාත්‍ර කිරීම.**
- **පළාතේ ආර්ථික සංවර්ධනයට ලබාදෙන දායකත්වය ඉහල නැංවීමට ව්‍යවසායකයින් පෙළඹවීම සහ දිරිගැන්වීම.**
- **තම ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ විශිෂ්ටත්වයට පත්වීමට ව්‍යවසායකයින් උනන්දු කරවීම.**

2020 වර්ෂයේදී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ඌව පළාතේ සහ ප්‍රාදේශීය සම්මාන ප්‍රදානෝත්සව පවත්වා අවසන් කර ඇති අතර, කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් අනෙකුත් පළාත්වල සම්මාන ප්‍රදානෝත්සව 2021 පළමු කාර්තුවේදී පැවැත්වීමට සැළසුම් කොට ඇත.





වැඩසටහන 9: "ශ්‍රී ලංකාවේ නිශ්පාදිතයි""Made in Sri Lanka" වෙළඳ නාමය (ලාංඡනය) ප්‍රවර්ධනය සහ ප්‍රදානය කිරීම



දේශීය සම්පත් යොදාගනිමින් දේශීයව පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර බොහොමයක් ඇතත්, ආනයනික නිශ්පාදන හා සැසඳීමේදී දේශීය නිශ්පාදන සඳහා නිසි පිළිගැනීමක් දක්නට නොලැබිණි. එබැවින් පාරිභෝගිකයින් ආනයනය කළ භාණ්ඩ මිල දී ගැනීම සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී තිබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය භාණ්ඩවලට වඩා ආනයනික භාණ්ඩ තත්ත්වයෙන් උසස් බව සිතීමට පාරිභෝගිකයින් පෙළැඹී සිටි අතර, දේශීය භාණ්ඩවලට පවතින ඉල්ලුම සීඝ්‍ර ලෙස පහත වැටීමකට ලක්විණි. මෙම තත්ත්වය පිළිබඳ සංවේදීතාවයක් දක්වමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් **"මේඩ් ඉන් ශ්‍රී ලංකා"** වෙළඳ නාමය (ලාංඡනය) යටතේ දේශීයත්වයට වැඩි වටිනාකමක් එක් කරමින්, දේශීය වශයෙන් නිශ්පාදනය කෙරෙන භාණ්ඩ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදි. 2020 වසරේදී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින්

“මේඩ් ඉන් ශ්‍රී ලංකා” වෙළඳ නාමය (ලාංඡනය) එළිදක්වන ලද අතර, ව්‍යවසායකයින් 10 දෙනෙකු සඳහා එම වෙළඳ නාමය ප්‍රදානය කරන ලදි.





10 වෙනත් වැඩසටහන්:

1. **ව්‍යාපාරික ගැටලු විසඳීම සඳහා ෆේස් බුක් සජීව වැඩසටහන**





2. **රූප ලාවන්‍ය ක්ෂේත්‍රය:**ව්‍යාපාරික ගැටලු නිරාකරණය සඳහා (ගරු අමාත්‍යතුමා සහ සභාපතිතුමාගේ සහභාගීත්වයෙන්) සමුළු දෙකක් පැවැත් වූ අතර, අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් ද පැවැත්විණි. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින්, රූප ලාවන්‍ය ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් 275 දෙනෙකු සඳහා ව්‍යවසායකත්වය, බදු, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් තැබීම සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මාර්ගෝපදේශ යනාදිය පිළිබඳ (කුරුණෑගල දිස්ත්‍රික්කයේ) දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.





3. කොවිඩ් 19 හේතුවෙන් විපතට පත් ව්‍යවසායකයින් සඳහා වෙළඳ පොළ සබඳතා (ආහාර සැකසුම්) වැඩසටහන





4. සන්මික් පුද්ගලික ආයතන (SUNMIC Pvt Ltd) සමග එක්ව ව්‍යවසායකයින් 35 දෙනෙකු සඳහා (ආහාර වර්ග හා ආයුර්වේද නිශ්පාදන) වෙළඳපොළ අවස්ථා ලබා දීම.

5. SEDD ආයතනය සමග එක්ව වෙළඳපොළ අවස්ථා වැඩසටහන පැවැත්වීම (ව්‍යවසායකයින් 30 දෙනෙකු සඳහා)

6. ව්‍යවසායකයින් මැලේසියානු ව්‍යාපාරික කවුන්සිලයේ ණය යෝජනා ක්‍රමයට සම්බන්ධ කරවීම. (පොලී රහිත)

7. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා කොළඹ සිටි සෙන්ටර්හි වෙළඳ කුටි පහසුකම් සපයා දීම. (ව්‍යවසායකයින් 80 දෙනෙකු සඳහා)





8. සුපිරි වෙළඳ සැල් වලට ඉදිරිපත් කිරීමට හැකි ආකාරයෙන් සිය නිශ්පාදනවල ගුණාත්මක භාවය ඉහල නැංවීම සඳහා ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයින් 23 දෙනෙකුට පුහුණු වැඩසටහනක් පැවැත්වීම (ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හා කිල්ස් ආයතනයේ හවුල්කාරීත්ව වැඩසටහනකි)





9. අගය එකතු කළ සෝයා නිශ්පාදන කර්මාන්තයේ නියැලී සිටින ව්‍යවසායකයින් සඳහා වෙළඳපොළ සබඳතා වැඩසටහන.

10. **සමීක්ෂණ දත්ත එකතු කිරීමේ වැඩසටහන**(අමාත්‍යාංශ වැඩසටහන) - කොවිඩ් 19 බලපෑම

11. **ආනයන ආදේශක වැඩසටහන:** ආනයන ක්ෂේත්‍රයේ තත්ත්වයන් හඳුනාගැනීම සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වකරුවන් සඳහා රැස්වීම් පවත්වන ලදි.(කොසු, සෝයා බෝංචි හා පොල් තෙල්, තීන්ත, උර සහ ගමන් මලු, කෘතිම මල්, නැවුම් පළතුරු හා කොටස් සහ රබර් මිශ්‍රිත ස්වයංක්‍රීය කොටස්, චොකලට්, පයිප්ප හා උපාංග, සෙරෙප්පු හා සපත්තු, අනුකරණ ආභරණ)

12. මානුෂීයත්වය හා ඇතුලත්භාවය(HI):ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ නියෝජිතයින් ඇතුළු ඌව පළාත් සංවර්ධන නිලධාරීන් සඳහා මානුෂීයත්වය හා ඇතුලත්භාවය (REF & DEF)පිළිබඳ සමාලෝචන රැස්වීමක් පවත්වන ලද අතර, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා සුළු ව්‍යාපාර උපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන් තුනක් සංවිධානය කරන ලදි.
මාතලේ දිස්ත්‍රික්කය සඳහා කියවීම් ද්‍රව්‍ය (අත් පත්‍රිකා) සකස් කිරීම. ව්‍යාපාර සංවර්ධන සේවා මාර්ගෝපදේශය - පිටපත් 2000 ක් මුද්‍රණය සඳහා සහාය ලබාදීම. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා ලැප්ටොප් පරිගණක 8ක් ලබාදීම.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2020 රු.	2019 රු.
මෙහෙයුම්			
මහ භාණ්ඩාගාර පුනරාවර්තන වෙන්කිරීම්		25,620,166.00	25,260,257.00
වෙනත් ආදායම්	7	1,663,867.25	549,756.00
වර්ෂය සඳහා සක්‍රිය වෙන්කිරීම්	18	25,938,783.00	40,953,786.00
රාජ්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රමක්ෂය සඳහා වෙන්කිරීම්	14	2,588,680.00	2,545,873.00
ආදායම් එකතුව		**55,811,496.25**	**69,309,672.00**
පරිපාලන වියදම්	8	30,582,420.14	29,499,033.00
වැඩසටහන් සඳහා වියදම්	9	23,046,172.20	37,057,416.00
වියදම් එකතුව		**53,628,592.34**	**66,556,449.00**
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය		**2,182,903.91**	**2,753,223.00**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	12,125,428	5,752,892
ජංගම වත්කම්			
ලැබීම්	11	261,887	1,754,416
තැන්පතු හා අත්තිකාරම්	12	11,692,415	89,970,926
පෙරගෙවුම් වියදම්	13	43,454	98,604
උත්සව අත්තිකාරම්		21,500	24,000
ආපදා ණය		2,006,512	2,232,034
වන්දනා අත්තිකාරම්		52,500	
මුදල් හා මුදල් සමානතා		4,585,238	351,521
සී/ස බී එක්ස්ප්‍රස් සමාගම	22	600	600
ජංගම වත්කම් එකතුව		**18,664,107**	**94,432,101**
ඉතිරි කිරීමේ ගිණුම් - පාරිතෝෂික		**608,702**	**583,670**
වෙනත් ජංගම වත්කම් එකතුව		**608,702**	**583,670**
වත්කම් එකතුව		**31,398,237**	**100,768,662**
හිමිකම් සහ වගකීම්			
හිමිකම්			
සමුච්චිත අතිරික්තය		6,554,761	6,026,770
හිමිකම් එකතුව		**6,554,761**	**6,026,770**
ජංගම නොවන වගකීම්			
රාජ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම්	14	9,271,630	2,899,092
විශ්‍රාම ප්‍රතිලාභ	15	1,779,934	1,692,735
ජංගම නොවන වගකීම් එකතුව		**11,051,564**	**4,591,826**
ජංගම වගකීම්			
වැඩසටහන් සඳහා වෙන්කිරීම්	16	9,384,721	86,131,768
උපචිත වියදම්	17	4,407,193	3,831,070
අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය	18	-	-
M/s.UNDP	18	-	187,228
ජංගම වගකීම් එකතුව		**13,791,915**	**90,150,066**
හිමිකම් හා වගකීම් එකතුව		**31,398,237**	**100,768,662**

පිටු අංක 05 සිට 19 දක්වා වන සටහන් මෙම මුල්‍ය ප්‍රකාශනයේ අනිවාර්ය අංගයකි.

අධිකාරියෙහි මුල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත සමඟ එකඟ වන බවට මම සහතික කරමි.

ගණකාධිකාරී

අත්සන් කළේ,

ලසන්ත කාරියප්පෙරුම
සභාපති/අධ්‍යක්ෂ ජනරාල්

මෙම මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

.....	.....
බී.ඒ.කේ.ඩබ් .එල් .පියන්ත	ටී.එම් .ආර්.තෙන්නකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වගකීම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

	සමුච්චිත අතිරික්තය	එකතුව
	රු.	රු.
2019 ජනවාරි 01 දිනට ශේෂය	49,798,341	49,798,341
වර්ෂය සඳහා මුළු අතිරික්තය	2,753,223	2,753,223
අත්තිකාරම් ගැලපුම්	(43,997)	(43,997)
බී.එක්ස්ප්‍රස් සමාගමේ ආයෝජනයට අදාළ ගැලපුම්	(46,450,000)	(46,450,000)
2018 වර්ෂය සඳහා ක්ෂයවීම් ගැලපුම්	(30,797)	(30,797)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,026,770**	**6,026,770**
වර්ෂය සඳහා මුළු අතිරික්තය	2,182,904	2,182,904
පෙර වර්ෂයට අදාළ ගැලපුම්	(1,654,913)	(1,654,913)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,554,761**	**6,554,761**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } වීඒසි/සී/එන්ටීසීඒ/එෆ්ඒ/2020 මෙබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 ජනවාරි 17 දින

සභාපති,
ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධාන යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව චක්‍ර ක්‍රමයට අනුව වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් ගැලපීම් ලෙස සටහන් කල යුත්තේ, බදු පෙර ලාභය ගණනය කිරීමේදී ගිණුම් ගත කරන ලද මුදලින් සිදු නොවූ ගනුදෙනුය. නමුත් ස්කන්ධය වෙන්වීමේ ප්‍රකාශයෙහි ගලපා ඇති පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් වටිනාකම් වූ රු.1,654,913ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ගැලපීම් යටතේ අඩුකර දක්වා තිබුණි. තවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 49 ඡේදය අනුව පෙර වර්ෂයට අදාල මෙම වැරදි නිවැරදි කිරීම් සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණ වසර 3 කට හෝ 5කට වතාවක් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.24,168,892ක් වූ මෝටර් රථ, රු.1,652,421ක් වූ කාර්යාල උපකරණ, රු.7,166,093ක් වූ කාර්යාල ලිබඩු, රු.5,873,613ක් වූ පරිගණක හා උපාංග හා රු.1,192,332ක් වූ පිරියත හා යන්ත්‍ර සූත්‍ර දීර්ඝ කාලයකින් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 අනුව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු වුවත්, රු.500,000ක් වැයකර ස්ථාපනය කර ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත පද්ධතිය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා නොගෙන වැඩසටහන් වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් වටිනාකම් පිළිවෙලින් රු.645,744ක් හා රු.7,737,500ක් වූ කාර්යාල ලිබඩු හා ටැබ් පරිගණක යන්ත්‍ර සම්බන්ධයෙන් ක්ෂය ගිණුම්ගත කර නොතිබීම් හේතුවෙන් ක්ෂය වියදම් හා ක්ෂය වෙන්කිරීම් පිළිවෙලින් රු.64,574කින් හා රු.1,934,375කින් ඌනගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අයිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනත	
(i) 13 (ආ)	විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම සඳහා කටයුතු කර නොනිබුණි.

(ii) 13 (ඇ)	තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ ජේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොනිබුණි.
(ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 103, 104 හා 110	(i) 2015 සිට 2019 කාලපරිච්ඡේදය තුල අධිකාරිය සතු රු.99,890ක් වටිනා ලැප්ටොප් පරිගණක දෙකක් හා රු.61,900ක් වටිනා ටැබ් පරිගණක යන්ත්‍ර දෙකක් අස්ථානගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සමාලෝචිත වර්ෂයේදී ද කර නොනිබුණි.
	(ii) PD-6379 අංක දරන කැබ් රථය සභාපතිවරයා විසින් ධාවනය කරමින් සිටින අවස්ථාවේ ජලය ප්‍රමාණවත්ව නොයෙදීම මත වාහනයේ එන්ජිමට හානි සිදු වී තිබුණි. ඒ පිළිබඳව මුදල රෙගුලාසි ප්‍රකාරව සිද කරන ලද පරීක්ෂණ වාර්තාවට අනුව අළුත්වැඩියාව සඳහා වැය වූ රු.498,110ක මුදල සභාපතිවරයාගෙන් අය කර ගත යුතු බවට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද එම මුදල අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොනිබුණි.
(ii) මුදල් රෙගුලාසි 371 (5)	අග්‍රිම ලබාදුන් වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම අග්‍රිම පියවිය යුතු නමුත්, 2017 වර්ෂයේ ලබා දුන් රු.352,250ක්, 2018 වර්ෂයේ ලබා දුන් රු.307,010ක්, 2019 වර්ෂයේ ලබා දුන් රු.419,072ක්, හා 2020 වර්ෂයේ ලබා දුන් රු.42,000ක අත්තිකාරම් මුදල්, 2023 දෙසැම්බර් 01 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොනිබුණි.
(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2020 හා 2021 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොනිබුණි.

(ඇ)2006 අංක 12 දරන මුද්දර බදු පනත හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය.	වටිනාකම රු.25,000ට වැඩි ගෙවීම් සඳහා රු.25ක් වූ මුද්දර ගාස්තු අයකළ යුතු වුවද අවස්ථා 69 දී රු.7,208,000ක ගෙවීම් වලට අදාලව මුද්දර ගාස්තු අඩුකර ගෙන නොනිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(ඉ) ලබා දුන් අත්තිකාරම් මුදල් වැය නොකර දින 22 සිට දින 148 දක්වා කාලයක රඳවාගෙන සිට සම්පූර්ණ වටිනාකම් රු.537,400ක්ම පියවා නිබුණු අවස්ථා 05ක් නිරීක්ෂණය විය.

(ඌ) ව්‍යවසායකයින්ට අවශ්‍ය වන තොරතුරු ඇතුළත් ව්‍යාපාර සංවර්ධන සේවා සැපයුම් නාමාවලියක් (Business Development Service Provider Directory) රු.852,070ක් වැයකර ඉංග්‍රීසි හා දෙමළ භාෂාවෙන් පිටපත් 500 බැගින් මුද්‍රණය කර නිබුණි. මෙම නාමාවලි බෙදාහැරීම සඳහා බෙදාහැරීමේ සැලැස්මක් නොනිබුණ අතර, මෙම වාර්තාවෙහි දිනය වන විට ඉංග්‍රීසි භාෂා පිටපත් 68ක් ඉතිරිව නිබූ අතර ඒවා නිසි පරිදි ගබඩා කර නොනිබුණි. තවද ඉතිරිව ඇති දෙමළ භාෂා පිටපත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවුණි.

(ඍ) B Express Ltd. ආයතනයෙන් වසරක සිට ලැබිය යුතුව පවතින රු.170,712ක් අයකර ගැනීමට කටයුතු කර නොනිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

வருடாந்த அறிக்கை 2020

தேசிய தொழில்முயற்சி அபிவிருத்தி அதிகாரசபை

கைத்தொழில் அமைச்சு

அறிமுகம்

தேசிய தொழில்முயற்சி அபிவிருத்தி அதிகாரசபையானது (தே.தொ.மு.அ) 2006ஆம் ஆண்டின் 17ஆம் இலக்கச் சட்டத்தின்கீழ் தாபிக்கப்பட்டது. நிறுவனத்தின் கட்டாயக் கடமையானது இலங்கையிலுள்ளள சிறிய, நடுத்தர தொழில்முயற்சிகளுக்கு (சிநதொமு) வசதிகளைச்செய்து கொடுப்பதாகும். அதிகாரசபையின் சட்டமானது, உள்ளூர் தொழில்முயற்சிகளுக்கு உட்கட்டமைப்பு வசதி, நிதி மற்றும் கொள்கை மட்டத்தில் உதவி ஒத்தாசைகளை வழங்குவதற்கு அதிகாரமளிக்கின்றது.

அதிகாரசபையானது, அதன் நேரடியான அமைச்சின் அறிவுரைகள் மற்றும் வழிகாட்டல்களுடன் பிராந்திய, அதேபோல தேசிய மட்டத்தில் பல்வேறு நடவடிக்கைகளிலும் ஈடுபட்டுள்ளது. தே.தொ.மு.அ.வானது, 2006ஆம் ஆண்டு தொடக்கம் 2010ஆம் ஆண்டுவரை முதலீட்டு ஊக்குவிப்பு அமைச்சின்கீழ் பட்டியலிடப்பட்டிருந்தது. தே.தொ.மு.அ.வானது, 2010ஆம் ஆண்டில் கைத்தொழில் மற்றும் வர்த்தக அமைச்சின்கீழ் பட்டியலிடப்பட்டிருந்ததுடன், அதன் பின் இற்றைவரை இது கைத்தொழில் மற்றும் வர்த்தக அமைச்சின்கீழ் முகாமைசெய்யப்படுகின்றது.

தே.தொ.மு.அ.வானது, சி.ந.தொமு. சமூகத்திற்காக, பல்வேறு நிகழ்ச்சித்திட்டங்கள், செயற்றிடங்கள் மற்றும் நடவடிக்கைகளை, பிரதேச செயலக மட்டத்தில் தொடங்கியுள்ளது. இது பொது மற்றும் தனியார் வங்கிகள், வியாபாரக் கழகங்கள், அரசுசார்பற்ற நிறுவனங்கள் (உள்ளூர் மற்றும் சர்வதேச நிறுவனங்கள்) போன்ற பொது மற்றும் தனியார் நிறுவனங்களுடன் தொடர்புகளைக் கொண்டுள்ளது. இந்த நிகழ்ச்சித்திட்டங்களின் நோக்கங்களாவன, நிதிசார் உதவிகள், பயிற்சியளித்தல், மதியுரைச்சேவை ஒத்தாசைகள் போன்ற அடிப்படைத் தேவைகளை சி.ந.தொ.மு. களின் அடிமட்டத்தில் வழங்குவதாகும். சி.ந.தொமு. களை பிரதேச செயலக மட்டத்தில் (பி.செ) ஒருங்கிணைப்பதற்காக பிராந்தியமட்ட அலுவலர்கள் பிரதேச செயலக (பி.செ) மட்டத்தில் ஈடுபடுத்தப்பட்டுள்ளனர்.

1. தொலைநோக்கும், பணிக்கூற்றும்:

தொலைநோக்கு:

நுண், சிறிய நடுத்தர தொழில்முயற்சிகளினை அபிவிருத்திசெய்து முன்னேற்றுதல், பாதுகாத்தல் மற்றும் கையாள்வதற்காக முன்னிலை வகிக்கும் முகமையாகவிருத்தல்.

பணிக்கூற்று:

ஏனைய தொழில்வல்லுநர்களுடன் ஒருங்கிணைந்து மற்றும் பங்காண்மை முறையில் சுறுசுறுப்பாகவும் வினைத்திறமையாகவும் உற்பத்தி நோக்குடன் நு.சி.ந.தொ.மு.களின் வளர்ச்சி, நிலைபேறான தன்மை ஆகியவற்றை நிச்சயிப்பதற்கு இலங்கையிலுள்ள நுண், சிறிய, நடுத்தர தொழில்முயற்சிகளினை அபிவிருத்திசெய்தல், முன்னேற்றுதல், பாதுகாத்தல் மற்றும் தரமுயர்த்தல்.

நோக்கங்கள்:

இலங்கைக்குள், சிறிய, நடுத்தர தொழில்முயற்சி அபிவிருத்திகளை ஊக்குவித்தல், தரமுயர்த்துதல் மற்றும் வசதிப்படுத்துவதன் மூலம் இலங்கையின் பொருளாதாரத்தின் வளர்ச்சி விரிவாக்கல் மற்றும் அபிவிருத்திக்கு ஊக்கமளித்தல்.

தே.தொ.அ.அ.இனதுஇ சட்டத்தின் நோக்கங்களை அடையுமுகமாக உள்நாட்டுத் தொழில் முயற்சிகளினைச் சர்வதேசத்திற்கும், வெளிநாட்டுச் சந்தைக்கும் ஏற்றவிதமாக உட்புகுத்தும் நோக்கத்துடன், தொழில்முயற்சி வடிவமைப்பினை இலங்கைக்கு வெளியே தாபிப்பதையும், தொழிற்படுத்துவதனையும், ஊக்கமளித்துத் தூண்டுதல்.

